ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

1988 අංක 53 දරන
ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන
ආයතනය පනත

[සහතිකය සටහන් කළේ 1988 දෙසැම්බර් මස 07 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1988 දෙසැම්බර් මස 09 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 1.20 යි. තැපැල් ගාස්තුව : ශත 75 යි.

1988 අංක 53 දරන ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය පනත

[සහතිකය සටහන් කළේ 1988 දෙසැම්බර් මස 07 වන දින]

එල්. ඩී.—ඕ 52/86

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය පිහිටුවීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.

1. මේ පනත 1988 අංක 53 දරන ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක සිට එය ක්‍රියාත්මක වන්නේ ය.

I වන කොටස

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය පිහිටුවීම

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය පිහිටුවීම.

2. මේ පනතේ විධිවිධානවලට අනුව, (මෙහි මින්මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු ආයතනයක් පිහිටුවනු ලබන්නේ ය.

ආයතනය සංස්ථාවක් වන බව.

3. 2 වන වගන්තිය මගින් ආයතනයට දෙන ලද නාමයෙන් ආයතනය අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් වන්නේ ය. තවද, ඒ නාමයෙන් ආයතනය විසින් නඩු පැවරිය හැකි අතර එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය.

ආයතනයේ මුද්‍රාව.

4. ආයතනයේ මුද්‍රාව—

(අ) ආයතනයේ විධායක අධ්‍යක්ෂවරයාගේ භාරයේ තිබිය යුතුය ;

(ආ) මණ්ඩලය විසින් අනුමත කරනු ලබන යම් මෝස්තරයක් අනුව විය යුතු අතර, මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් ආකාරයකට එය වෙනස් කරනු ලැබිය හැකි ය.

(ඇ) මණ්ඩලයේ අනුමතය ඇතිව මිස හෝ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන රීති අනුව මිස, යම් ලියවිල්ලකට නොතැබිය යුතු ය.

ආයතනයේ අරමුණු සහ පරමාර්ථ.

5. ආයතනයේ අරමුණු හා පරමාර්ථ වන්නේ සමාජ ආර්ථික පර්යේෂණ කටයුතුවල නිරතවීම, ඒවාට අනුබලදීම, ඒවා පෝෂණය කිරීම සහ ඒවා පහසු කිරීම සහ විශේෂයෙන් පහත දැක්වෙන කටයුතු ය :—

(අ) ජාතික සංවර්ධන සැලැසුම්වලට සහ ප්‍රතිපත්තිවලට අදාළව අධ්‍යයන ආරම්භ කිරීම, ප්‍රවර්ධනය කිරීම හා පවත්වා ගෙනයාම ;

2—ඒ104487 (88/08)

(ආ) සංවර්ධන අධ්‍යයනවලට සම්බන්ධ ආණ්ඩුවේ ආයතන, විශ්ව විද්‍යාල සහ පර්යේෂණ ආයතන සමග සම්බන්ධතා ඇති කර ගැනීම හා ඒ සම්බන්ධතා පවත්වාගෙන යාම සහ එම කාර්යය සඳහා, පර්යේෂණ කටයුතු හා අධ්‍යයන පිළිබඳව සාකච්ඡා පැවැත්වීම හා ඒවා අගැයීම සඳහා සාකච්ඡා සහා සැපයීම ;

(ඇ) ආණ්ඩුව විසින් හෝ ආණ්ඩුවේ ආයතන විසින් හෝ යම් ජාත්‍යන්තර ආයතනයක් විසින් කරනු ලබන ඉල්ලීම් අනුව සමාජ ආර්ථික පර්යේෂණ භාර ගැනීම හා පවත්වා ගෙන යාම ;

(ඈ) දේශීය හෝ විදේශීය පර්යේෂණ ආයතන මගින් හෝ පුද්ගලයන් මගින්, සමාජ ආර්ථික පර්යේෂණ පවත්වා ගෙන යාම සඳහා විධිවිධාන යෙදීම ;

(ඉ) විදේශීය පර්යේෂණ ආයතන හා ශ්‍රී ලංකාවේ පර්යේෂණ ආයතන සමග එක්වී අධ්‍යයන, සම්මන්ත්‍රණ හෝ සාකච්ඡා මුළු පවත්වාගෙන යාම ;

(ඊ) ප්‍රතිපත්ති පර්යේෂණ සම්බන්ධ ප්‍රතිඵල පතුරුවාලීම සහ රජයේ ප්‍රතිපත්තිය සකස් කිරීම හා අගැයීම සම්බන්ධයෙන් ඒ ප්‍රතිඵලවල බලපෑම උපරිම තත්ත්වයට පත් කිරීම සඳහා පියවර ගැනීම ;

(උ) ආර්ථික හා සමාජ පර්යේෂණ තොරතුරු සහ වෙනත් අදාල කරුණු රැස් කර තැබීම සඳහා ගබඩාගාරයක් පිහිටුවීම ;

(ඌ) ආයතනයේ පරමාර්ථවලට සමාන අරමුණු සහිත පරමාර්ථ ඇති ශ්‍රී ලංකාවේ හා විදේශයන්හි පර්යේෂණ ආයතන සමග සම්බන්ධකම් පිහිටුවා පවත්වාගෙන යාම සහ ඒ ආයතන සමග සහයෝගයෙන් හා ඒ සම්බන්ධව ක්‍රියා කිරීම පිණිස පහසුකම් සැලසීම.

ආයතනයේ බලතල.

6. තම අරමුණු හා පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම පිණිස අවශ්‍ය වන බලතල ආයතනයට තිබෙන අතර විශේෂයෙන්ම පහත දැක්වෙන කටයුතු කිරීම සඳහා බලය තිබෙන්නේය :—

(අ) ආයතනයේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා රීති සෑදීම ;

(ආ) දේශීය හෝ විදේශීය ප්‍රභවයන්ගෙන් චංචල හා නිශ්චල යන දෙවර්ගයේම ප්‍රදාන, පරිත්‍යාග, ත්‍යාග හා රික්ථවරණ භාර ගැනීම හා පිළිගැනීම සහ ආයතනයේ පරමාර්ථ හා අරමුණු ප්‍රවර්ධන කිරීම සඳහා ඒවා අදාල කර ගැනීම ;

(ඇ) යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නියාදනයක් මගින් හෝ අන්‍යාකාරයකින් ආයතනය වෙත සතුවන චංචල හෝ නිශ්චල දේපළ අත්කර ගැනීම හා දැරීම සහ ආයතනයේ රීතිවලට යටත්ව ඒවා විකිණීම, පැවරීම, හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම ;

(ඈ) තම අරමුණු හා පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය යයි සලකනු ලබන යම් ගිවිසුම්වලට එළඹීම ;

(ඉ) ආයතනයේ අරමුණු හා පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය වන පරිදි හෝ ප්‍රයෝජනවත් වන පරිදි, යම් නිලධරයන්, සේවකයන් හෝ නියෝජිතයන් පත් කිරීම, සේවා නියුක්ත කිරීම, ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම සහ ඔවුන් සම්බන්ධයෙන් විනය පාලනය ක්‍රියාත්මක කිරීම ;

(ඊ) කාර්ය මණ්ඩල, උපදේශක සේවා, පර්යේෂණ, කාර්ය මණ්ඩල පුහුණු කිරීම යන මේවා හුවමාරු කර ගැනීම සඳහා හෝ සාමාන්‍ය වශයෙන් තම පොදු පරමාර්ථවලට හිතකර යම් කාර්ය සඳහා, ආයතනයේ පරමාර්ථවලට සම්පූර්ණ වශයෙන් හෝ අඩ වශයෙන් සමාන පරමාර්ථ ඇති, ශ්‍රී ලංකාවේ හෝ විදේශයක අධ්‍යාපනික හෝ වෙනත් ආයතන සමග සහයෝගිතා ගිවිසුම්වලට එළඹීම ;

(උ) යම් බැංකුවක හෝ බැංකුවල ජංගම ගිණුම්, ඉතිරි කිරීමේ ගිණුම් හෝ තැන්පතු ගිණුම් ආරම්භ කිරීම සහ පවත්වා ගෙන යාම ;

(ඌ) තම අරමුදල් මණ්ඩලය විසින් අනුමත කරනු ලබන යම් සුරැකුම්වල ආයෝජනය කිරීම ;

(එ) ආයතනයේ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ අර්ථ ලාභය සඳහා අර්ථසාධක අරමුදල් හෝ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම ඇති කිරීම සහ එවැනි අරමුදල්වලට හෝ යෝජනා ක්‍රමවලට දායකවීම ;

(ඒ) තම කර්තව්‍ය ඉටුකිරීම සඳහා අවශ්‍ය වන මුදල් ණයට ගැනීම ;

(ඔ) පුස්තකාල ඉදි කිරීම, සජ්ජිත කිරීම හා නඩත්තු කිරීම ;

(ඕ) තම නිලධරයන්ගේ හා සේවකයන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම ;

(ක) ප්‍රකාශන නිකුත් කිරීම ;

(ග) තම පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සහ තම කර්තව්‍යයන් ඉටු කිරීම පහසු කරවීම සඳහා ආයතනයේ මතය අනුව, අවශ්‍යවන වෙනත් සියලු කටයුතු භාර ගැනීම.

II වන කොටස

ආයතනය සංවිධානය කිරීම හා කළමනාකරණය කිරීම

7. ආයතනයේ කටයුතු පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත පාලක මණ්ඩලයක් වෙත පැවරෙන්නේය :— ආයතනයේ පාලක මණ්ඩලය.

(අ) 9 වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ මණ්ඩලයේ සභාපතිවරයා ;

(ආ) ක්‍රමසම්පාදන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ;

(ඇ) ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා ;

(ඈ) ජාතික ක්‍රම සම්පාදන අධ්‍යක්ෂවරයා ; සහ

(ඉ) දෙදෙනෙකු ආර්ථික විද්‍යා ක්ෂේත්‍රයෙන් තෝරා ගනු ලැබිය යුතු වූ ද අනෙක් තැනැත්තා ආර්ථික විද්‍යාව නොවන, සමාජ විද්‍යාවට අයත් ක්ෂේත්‍රයකින් තෝරා ගනු ලැබිය යුතු වූ ද, එසේම ක්‍රම සම්පාදන විෂයය භාර අමාත්‍යවරයා විමසා, ජනාධිපතිවරයා විසින් පත් කළ යුතු වූ ද (මෙහි මින් මතු "පත් කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකාවේ අධ්‍යයන හා පර්යේෂණ අංශවලින් තෝරා ගනු ලබන සාමාජිකයන් තිදෙනෙක්.

ධුර කාලය.

8. (1) පත් කළ සාමාජිකයකු අවුරුදු තුනක කාල සීමාවක් ධුරය දැරිය යුතු අතර, යළි පත් කරනු ලැබීමට ද ඔහුට සුදුසුකම ඇත්තේ ය.

(2) යම් තැනැත්තකු පත් කරනු ලැබීමට හෝ මණ්ඩලයේ සාමාජිකයකු ලෙස දිගටම කටයුතු කිරීමට හෝ පහත දැක්වෙන කරුණු හේතු කොට නුසුදුස්සෙක් වන්නේ ය :—

(අ) නිසි බලය ඇති අධිකරණයක් විසින් සිහිවිකල තැනැත්තකු බව විනිශ්චය කරනු ලැබුවහොත් ; හෝ

(ආ) නිසි බලය ඇති අධිකරණයක් විසින් ඔහු බුන්වත් වූ තැනැත්තකු බවට ප්‍රකාශ කරනු ලැබුවහොත්.

(3) මරණය සිදුවීම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම නිසා පත් කළ සාමාජිකයකුගේ ධුරය හිස් වීමේ ප්‍රතිඵලයක් වශයෙන් මණ්ඩලයේ ඇති වන පුරප්පාඩුවක්, 7(ඉ) වන වගන්තියේ විධිවිධානවලට සැළකිලිමත් වෙමින් ක්‍රම සම්පාදන විෂයය භාර අමාත්‍යවරයා විමසා, ජනාධිපතිවරයා විසින් පිරවිය යුතු අතර එසේ පත් කරනු ලබන සාමාජිකයා විසින් තම පූර්වගාමියාගේ ඉකුත් නොවූ ධුර කාලය තුළ ධුරය දැරිය යුතු ය.

(4) පත් කළ සාමාජිකයකු අසනීපවීම, අබලතාවට පත් වීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැර වී සිටීම හේතුකොට ගෙන මාස තුනකට නොඅඩු කාලයක් තම කාර්ය ඉටු කිරීමට තාවකාලික වශයෙන් ඔහුට නොහැකි වන අවස්ථාවක ක්‍රම සම්පාදන විෂයය භාර අමාත්‍යවරයා විමසා ජනාධිපතිවරයා විසින් ඔහු වෙනුවට වැඩ බැලීම සඳහා වෙනත් තැනැත්තකු පත් කළ හැකි ය.

(5) මණ්ඩලයේ යම් සාමාජිකයකු විසින්, ඕනෑම අවස්ථාවක, ජනාධිපතිවරයා අමතන ලද ලිපියක් මගින් තම ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

මණ්ඩලයේ සභාපතිවරයා.

9. (1) ජනාධිපතිවරයා විසින්, ක්‍රම සම්පාදන විෂයය භාර අමාත්‍යවරයා විමසා මණ්ඩලයේ සභාපතිවරයා පත් කළ යුතු ය.

(2) සභාපතිවරයා විසින්, කවර වූ හෝ අවස්ථාවක ජනාධිපතිවරයා වෙත අමතන ලද ලිපියක් මගින් සභාපති ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(3) සභාපතිවරයා අසනීප වීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැර ව් සිටීම හේතු කොට ගෙන, තම ධුරයේ කාර්යය ඉටු කිරීමට තාව කාලික වශයෙන් ඔහුට නොහැකි වුවහොත්, ජනාධිපතිවරයා විසින් ක්‍රම සම්පාදන විෂයය භාර අමාත්‍යවරයා විමසා ඔහු වෙනුවට වැඩ බැලීම සඳහා මණ්ඩලයේ වෙනත් සාමාජිකයකු පත් කළ හැකි ය.

(4) (2) වන හා (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව සභාපතිවරයාගේ ධුර කාලය අවුරුදු තුනක් වන්නේ ය.

10. (1) මණ්ඩලයේ රැස්වීම්වල මූලාසනය සභාපතිවරයා විසින් දැරිය යුතු ය. සභාපතිවරයා යම් රැස්වීමකට පැමිණ නොමැති අවස්ථාවක ඒ රැස්වීමට පැමිණ සිටින මණ්ඩලයේ සාමාජිකයන් විසින් තෝරා ගනු ලබන වෙනත් සාමාජිකයකු එම රැස්වීමේ මූලාසනය දැරිය යුතු ය. **මණ්ඩලයේ රැස්වීම් කටයුතු.**

(2) ඡන්ද සමාන වූ අවස්ථාවක හැර ඡන්දය දීමේ හිමිකම යම් රැස්වීමක සභාපතිවරයාට හෝ මූලාසනය දරන සාමාජිකයාට නොමැත්තේ ය.

(3) මේ පනත මගින් ආයතනය වෙත පවරන ලද යම් බලයක් හෝ නියම කරන ලද යම් කාර්යයක් හෝ භාරදෙන ලද යම් කර්තව්‍යයක් මණ්ඩලය විසින් සභාපතිවරයා වෙත පැවරිය හැකි ය.

(4) යටත් පිරිසෙයින්, සෑම ලිත් මාස හයක කාල සීමාවකට ම වරක් මණ්ඩලය රැස්විය යුතු ය.

(5) රැස්වීමක ගණපූරණය, සභාපතිවරයා ද ඇතුළුව, සාමාජික යන් හතර දෙනෙකු වන්නේ ය.

(6) මේ පනතේ විධිවිධානවලට යටත්ව, රැස්වීම්වලට පැමිණීම වෙනුවෙන් තම සාමාජිකයන් වෙත ගෙවිය යුතු සම්මාන මුදල් හා වියදම් ප්‍රතිපූරණය ද ඇතුළුව, රැස්වීම් පිළිබඳ කාර්ය පටිපාටිය සහ එම රැස්වීමේ කටයුතු පවත්වා ගෙන යාම සම්බන්ධ යෙන් මණ්ඩලය විසින් රීති සාදනු ලැබිය යුතු ය.

11. සාමාජිකත්වයේ යම් පුරප්පාඩුවක් තිබීම නොතකා ක්‍රියා කිරීමට මණ්ඩලයට බලය තිබෙන අතර, එවැනි යම් පුරප්පාඩුවක් තිබීම හෝ සාමාජිකයකුගේ පත්වීමේලා යම් දෝෂයක් තිබීම හේ හේතු කොට ගෙන පමණක්ම මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ කටයුතු නිර්මල නොවන අතර නිර්මල වී ඇති ලෙස සලකනු නොලැබිය යුතු ය. **සාමාජිකයකුගේ පුරප්පාඩුවක් හෝ සාමාජිකයකුගේ පත්වීමේලා යම් දෝෂයක් තිබීම හේතු කොට ගෙන මණ්ඩලයේ ක්‍රියා හෝ කටයුතු නිර්බල වී ඇති ලෙස සලකනු නොලැබිය යුතු බව.**

පර්යේෂණ උපදේශක කමිටු.

12. (1) ආයතනයේ ආධාරය හා සහාය ඇතිව භාර ගනු ලැබිය යුතු ප්‍රතිපත්ති අධ්‍යයන වැඩ පිළිවෙළ සම්බන්ධයෙන්, මණ්ඩලයට උපදෙස් දීම පිණිස පර්යේෂණ උපදේශක කමිටුවක් මණ්ඩලය විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් හෝ විදේශ ආණ්ඩුවලින් හෝ ශ්‍රී ලංකාවේ හෝ විදේශවල ශාස්ත්‍රීය හෝ පර්යේෂණ ක්ෂේත්‍රයන්ගෙන් ලබාගත් සංවර්ධන අධ්‍යයනයට අදාළ පර්යේෂණ ක්ෂේත්‍රයෙහි නිරතව සිටින තැනැත්තන්ගෙන් කමිටුව සමන්විත විය යුතු ය.

කමිටුවේ කර්තව්‍ය හා වගකීම.

13. මේ පනතේ විධිවිධානවලට සහ ආයතනයේ රීතිවලට යටත්ව, පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් මණ්ඩලයට උපදෙස් දීම කමිටුවේ කර්තව්‍ය හා වගකීම් වන්නේ ය :—

(අ) ආයතනයේ පර්යේෂණ වැඩ පිළිවෙළ සම්බන්ධයෙන් සාමාන්‍ය විධාන දීම හා අවධාරණය කිරීම ;

(ආ) පර්යේෂණ තෝරා ගැනීම, සැලසුම් කිරීම හා ඒවායේ විධි ශාස්ත්‍රය ;

(ඇ) පර්යේෂණවලින් අනාවරණය වන කරුණු අගැයීම, බෙදා හැරීම හා ප්‍රකාශයට පත් කිරීම ; සහ

(ඈ) කමිටුවේ උපදෙස් අපේක්ෂා කරනු ලබන වෙනත් කරුණු.

III වන කොටස

විධායක අධ්‍යක්ෂවරයාගේ කර්තව්‍යයන් හා වගකීම්

අධ්‍යක්ෂවරයා පත් කිරීම.

14. (1) ක්‍රම සම්පාදන විෂයය භාර අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ උපදෙස් මත, (මෙහි මින් මතු " අධ්‍යක්ෂවරයා " යනුවෙන් සඳහන් කරනු ලබන) ආයතනයේ විධායක අධ්‍යක්ෂවරයා පත් කළ යුතු අතර, ඔහු ආයතනයේ පර්යේෂණ කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු ද වන්නේ ය. අධ්‍යක්ෂවරයා ආයතනයේ පූර්ණ කාලීන නිලධරයකු වන අතර, මණ්ඩලය විසින් නිරණය කරනු ලබන යම් පාරිශ්‍රමික හා වෙනත් අර්ථලාභ ඔහුට ලැබිය යුතු ය.

(2) අධ්‍යක්ෂවරයා මණ්ඩලයට වගකිව යුතු වන්නේ ය. ඔහු උපදේශක තත්ත්වයෙන් මණ්ඩලයේ රැස්වීම්වලට සහභාගි විය යුතු නමුත් ඒ රැස්වීම්වල දී ඡන්දය දීමට ඔහුට හිමිකම නොමැත්තේ ය.

(3) මණ්ඩලය විසින් අධ්‍යක්ෂවරයා වෙත පවරනු ලබන යම් බලතල, කර්තව්‍ය හා කාර්ය ඔහු විසින් ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හා සපුරාලීම කළ යුතු ය.

15. (1) විශේෂඥ අධ්‍යයනයන් හෝ පර්යේෂණ කරගෙන යාම සඳහා, ආයතනයේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන පර්යේෂකයන් සහ වෘත්තීය විද්වතුන් සමග ගිවිසුම්වලට එළඹීමට ආයතනයට හිමිකම ඇත්තේ ය.

ආයතනය සමග ගිවිසුම්වලට එළඹීමට කාර්ය මණ්ඩලයට අයත් නොවන සාමාජිකයන්ට ඇති අවස්ථාව.

(2) (1) වන උපවගන්තිය යටතේ ආයතනය සමග ගිවිසුමකට එළඹ සිටින සෑම තැනැත්තකුම පර්යේෂණ ආශ්‍රිතයකු ලෙස සලකනු ලැබිය යුතු අතර, මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ගාස්තු ද ඔහුට ගෙවනු ලැබිය යුතු ය.

IV වන කොටස

මුදල්

16. (1) ආයතනයට ආයතනයේ ම අරමුදලක් තිබිය යුතු වන්නේ ය.

ආයතනයේ අරමුදල.

(2) ආයතනයේ අරමුදලට පහත දැක්වෙන මුදල් එකතු කරනු ලැබිය යුතු ය :—

(අ) ආයතනයේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, හා ඉටු කිරීමේ දී ආයතනයට ලැබෙන සියලු මුදල් ;

(ආ) දේශීය වූ හෝ විදේශීය වූ හෝ ඕනෑම ප්‍රභවයකින් ගාස්තු, ප්‍රදාන, පරිත්‍යාග, ත්‍යාග හෝ රික්ථවිරණ වශයෙන් ආයතනයට ලැබෙන සියලු මුදල් ; සහ

(ඇ) ආයතනය විසින් ණයට ගනු ලබන සියලු මුදල්.

(3) ආයතනයේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී, කාර්ය කිරීමේ දී, හා කර්තව්‍ය ඉටු කිරීමේ දී ආයතනය විසින් දරනු ලබන වියදම් පියවීම සඳහා අවශ්‍ය වන සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

17. ආයතනයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය වන්නේ ය.

මුදල් වර්ෂය ගිණුම් විගණනය කිරීම.

18. (1) ආයතනයේ ආදායම් හා වියදම්, වත්කම් හා ණයතුරුස් සහ වෙනත් සියලු ගණුදෙනු සම්බන්ධයෙන් නිසි ගිණුම් පොත් තබා ගැනීමට මණ්ඩලය විසින් සැලැස්විය යුතු ය.

(2) එක් එක් වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දින වන විට තම පොත් තුලනය කිරීමට මණ්ඩලය විසින් සැලැස්විය යුතු අතර, ඊළඟ මාර්තු මස තිස් එක් වන දිනට පෙර, මුලින් සඳහන් කළ දිනය දක්වා සාදන ලද ආයතනයේ වත්කම් හා ණයතුරුස් පිළිබඳ සාරාංශයක් අඩංගු ආදායම් හා වියදම් ගිණුමක් හා ශේෂ පත්‍රයක් සකස් කිරීමට ද මණ්ඩලය විසින් සැලැස්විය යුතු ය.

(3) ආදායම් හා වියදම් පිළිබඳ ගිණුම හා ශේෂ පත්‍රය මණ්ඩලයේ සභාපතිවරයා සහ ආයතනයේ අධ්‍යක්ෂවරයා විසින් අත්සන් කළ යුතු ය.

(4) ආයතනයේ ගිණුම් විගණනය කිරීම පිණිස (මෙහි මින් මතු "විගණකවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) සුදුසුකම් ලත් විගණකවරයකුගේ සේවය මණ්ඩලය විසින් ලබාගත හැකි ය.

(5) ආයතනයේ ගිණුම් විගණනය කිරීමේ දී, යම් විගණකවරයකු විසින් දරනු ලබන වියදම් පියවීම සඳහා, මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් පාරිශ්‍රමිකයක් ආයතනය විසින් එම විගණකවරයාට ගෙවිය යුතු ය.

(6) විගණකවරයා විසින් එම ආයතනයේ ගිණුම් සහ මුදල් ද මුදල් සහ දේපළ කළමනාකරණය කිරීම ද පරීක්ෂා කර බැලිය යුතු ය. විගණකවරයා විසින්, හැකි තාක් දුරට සහ අවශ්‍ය වන ප්‍රමාණයට පහත දැක්වෙන කරුණු විභාග කර බැලිය යුතුය :—

(අ) ආයතනයේ කටයුතු අඛණ්ඩව, අගැයීමට හැකිවන පරිදි, තොරතුරු ඉදිරිපත් කිරීම වශයෙන්, සංවිධානය, ක්‍රම, කාර්ය පටිපාටිය, පොත්, වාර්තා හා වෙනත් ලේඛන නිසි පරිදි හා ප්‍රමාණවත් ලෙස සැලසුම් කොට තිබේද යන බව සහ එම ක්‍රම, කාර්ය පටිපාටි, පොත්, වාර්තා හා වෙනත් ලේඛන ඵලදායි ලෙස ක්‍රියාත්මක වන්නේ ද යන වග ;

(ආ) ආයතනයේ මූල්‍ය පාලනය ආයතනයට අදාළ නීති, රීති හා නියෝගවලට අනුකූලවන්නේ ද යන වග සහ ආයතනයේ මූල්‍ය පරිපාලනය සාධාරණ ලෙස සිදු වන්නේ ද යන වග ;

(ඇ) මුදල් වෙන්කර තැබීම හා එම අරමුදල් උපයෝගී කරගැනීම සකසුරුවම් ලෙස සහ කාර්යක්ෂම ලෙස සිදු කොට තිබේ ද යන වග ;

(ඈ) මුදල් තබා ගැනීමේ සහ දේපළ ආරක්ෂා කිරීමේ ක්‍රම සතුටුදායකද යන වග ;

(ඉ) ගණකාධිකරණය, මුදල් යෙදීම හා අගැයීම පිළිබඳ මූලධර්ම පිළිබඳව නිසි ලෙස සැලකිලිමත්ව සලකා බලන විට, විගණනය කරන ලද ගිණුම්, විගණනයට භාජනය වූ කාල සීමාව සම්බන්ධයෙන්, ආයතනයේ කටයුතු පිළිබඳ සත්‍ය හා සාධාරණ තත්ත්වය පෙන්නුම් කරන පරිදි සැලසුම් කොට තිබේද යන වග ; සහ

(ඊ) අවශ්‍ය යයි ඔහු විසින් සලකනු ලබන වෙනත් කරුණු.

(7) විගණකවරයා විසින්, යම් විශේෂ කාල සීමාවක් තුළ පවත්වා ගෙන යා යුතු විගණනයේ ස්වභාවය හා ප්‍රමාණය තීරණය කළ යුතු අතර, යම් විශේෂ අංශයක් අනවශ්‍ය ලෙස සලකනු ලැබිය හැකි ය.

(8) විගණකවරයාට පහත දැක්වෙන කටයුතු සඳහා අයිතිවාසිකම් තිබෙන්නේ ය :—

(අ) ආයතනයේ කටයුතුවලට කෙලින් ම හෝ අනියම් ආකාරයෙන් අදාළ වන යම් පොත්, වාර්තා, ලේඛන හා ඕනෑම ආකාරයක තොරතුරක් පරීක්ෂා කර බැලීම ;

(ආ) තම මතය අනුව, විගණනය පිළිබඳ කාර්යයන් සඳහා අවශ්‍ය වන යම් තොරතුරු, ලේඛන, කරුණු පැහැදිලි කිරීමේ වාර්තා හෝ වෙනත් කරුණු ඕනෑම වේලාවක ඉල්ලා සිටීම ;

(ඇ) විගණනය පිළිබඳ කාර්යයන් සඳහා යම් තැනැත්තකුගෙන් ප්‍රශ්න කිරීම පිණිස සහ යම් ලේඛනයක් ඉදිරිපත් කිරීම පිණිස ඒ තැනැත්තා කැඳවීම අවශ්‍ය යයි සලකනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තාගෙන් එසේ ප්‍රශ්න කිරීම පිණිස සහ එම ලේඛනය ඉදිරිපත් කිරීම පිණිස ඒ තැනැත්තා කැඳවීම.

(9) ඉහත සඳහන් ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමෙහි ලා විගණක වරයා විසින් කරනු ලබන යම් ඉල්ලීමක් ආයතනය හෝ ආයතනයේ ඕනෑම තැනැත්තකු විසින් ඉටු කළ යුතු ය.

(10) එක් එක් මුදල් වර්ෂය අවසානවීමෙන් මාස හතරක් ඇතු ළත විගණනය කිරීම සඳහා ඒ වර්ෂය සඳහා වූ ආයතනයේ ගිණුම් විගණකවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර ඒ සමඟ, විගණකවරයා විසින් සඳහන් කරනු ලබන ආකාරයට ඉදිරිපත් කළ යුතු ලෙස නියම කරනු ලබන ගිණුම් පිළිබඳ වාර්තාවක් ද ඔහු වෙත ඉදිරිපත් කළ යුතු ය. මෙම උපවගන්තියේ ඉහත දක්වෙන විධිවිධාන උල්ලංඝ නය කරන හෝ පිළිනොපදින ඕනෑම තැනැත්තෙක් හෝ මේ පනත යටතේ වරදක් කරන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට ද ඔහු යටත් වන්නේ ය.

(11) මුදල් වර්ෂය අවසානවීමෙන් පසුව මාස අටක් ඇතුළත, වර්ෂයේ පරීක්ෂා කරන ලද ගිණුම් පිළිබඳ වාර්තාවක්ද ඇතුළුව, විගණනය පිළිබඳ ප්‍රතිඵල පිළිබඳ වාර්තාවක් විගණකවරයා විසින් ආයතනයේ සභාපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. තවද, ඔහු විසින් එම වාර්තාවේ පිටපත්—

(අ) විෂයය භාර අමාත්‍යවරයා මුදල් අමාත්‍යවරයාද වන අවස්ථා වක, ඒ අමාත්‍යවරයා වෙත ; හෝ

(ආ) විෂයය භාර අමාත්‍යවරයා මුදල් අමාත්‍යවරයා ද නොවන අවස්ථාවක, විෂයය භාර අමාත්‍යවරයා සහ මුදල් අමාත්‍ය වරයා යන දෙදෙනා වෙතම,

ඉදිරිපත් කළ යුතුවේ.

(12) මෙම වගන්තියේ කාර්යය සඳහා "සුදුසුකම්ලත් විගණක වරයා" යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ සාමාජික යකු වූ ද ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදී මට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතික යක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ආ) යම් වරලත් ගණකාධිකාරී සමාගමක එක් එක් හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ සාමාජිකය කු ව සිටින්නේද එමෙන්ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේද එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක් හෝ

අදහස් වේ.

බදුවලින් නිදහස් කිරීම.

19. (1) යම් පළාත් පාලන ආයතනයක් විසින් පනවනු ලබන යම් වරිපනම් ගාස්තුවලින් ආයතනය නිදහස් කරනු ලැබිය යුතු ය.

(2) ආයතනය විසින් ආනයනය කරනු ලබන භාණ්ඩ සඳහා ආනයන බලපත්‍රයක් මත අයකළ යුතු ඇතැම් ගාස්තු අමාත්‍යවරයා විසින් මුදල් පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයා විමසා අත හැර දැමිය හැකි ය.

(3) 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 31 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඈ) ඡේදය යටතට ආයතනය ඇතුළත් කරන ලද අවස්ථාවේ සිට හා ඊට පසුව, යම් තැනැත්තකු විසින් ආයතනය වෙත මුදලින් කරන ලද පරිත්‍යාග සම්බන්ධයෙන් ඒ වගන්තියේ සඳහන් සහනවලට ඒ පනතේ වෙනත් විධිවිධානයන්ට යටත්ව, ඔහුට හිමිකම් තිබෙන්නේ ය.

(4) 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ පිළිවෙළින් වූ 8 වන හා 42 වන වගන්ති යටතට ආයතනය ඇතුළත් කරන ලද අවස්ථාවේ සිට හා ඊට පසුව, ආයතනයේ ලාභ හා ආදායම, ආදායම් බද්දෙන් නිදහස් විය යුතු අතර, ආයතනය ධන බද්දෙන් ද නිදහස් කරනු ලැබිය යුතු ය.

(5) 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 9 වන වගන්තිය යටතට ආයතනය ඇතුළත් කරන ලද අවස්ථාවේ සිට සහ ඊට පසුව ආයතනයේ සෑම නිලධරයකුගේ ම සහ සේවකයකුගේ ම පඩිනඩි ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

V වන කොටස

සාමාන්‍ය කරුණු

නිලධරයන් හා සේවකයන් පත් කිරීම.

20. (1) මණ්ඩලය විසින් ආයතනය පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා අවශ්‍යවන යම් නිලධරයන්, සේවකයන් හා උපදේශකයන් පත් කළ හැකි අතර, එසේ පත් කරනු ලබන නිලධරයන්ගේ, සේවකයන්ගේ හා උපදේශකයන්ගේ පාරිශ්‍රමිකය සහ සේවා කොන්දේසි ද තීරණය කළ යුතු ය.

(2) මණ්ඩලයේ ඉල්ලීම පිට, රාජ්‍ය සේවයේ යම් නිලධරයකු, ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව, මණ්ඩලය විසින්, එකී කැමැත්තම ඇතිව තීරණය කරනු ලබන යම් කාලසීමාවකට ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබීම හෝ එකී කැමැත්ත අනුව එම කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබීම හෝ කරනු ලැබිය හැකි ය.

(3) ආයතනයේ කාර්ය මණ්ඩලයට රාජ්‍ය සේවයේ යම් නිලධරයකු තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ, 1978 අංක 19 දරන ගමනා ගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඔහුට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

(4) ආයතනයේ කාර්ය මණ්ඩලයට රාජ්‍ය සේවයේ යම් නිලධරයකු ස්ථිරවම පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනා ගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහුට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ වන්නේය.

(5) මණ්ඩලයේ ඉල්ලීම පිට, 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත යටතේ පිහිටුවන ලද යම් උසස් අධ්‍යාපන ආයතනයක යම් නිලධරයකු හෝ සේවකයකු, ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ සහ ඒ උසස් අධ්‍යාපන ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයාගේ කැමැත්ත ඇතිව, සහ මණ්ඩලය සහ එම ප්‍රධාන විධායක නිලධරයා විසින් ගිවිස ගනු ලබන, විශ්‍රාම වැටුප් හා අර්ථ සාධක අරමුදල් පිළිබඳ අයිතිවාසිකම්වලට අදාළ කොන්දේසි ද ඇතුළු කොන්දේසිවලට යටත්ව, ආයතනයේ කාර්ය මණ්ඩලයට මණ්ඩලය විසින් එකී කැමැත්තම ඇතිව තීරණය කරනු ලබන යම් කාලසීමාවක් සඳහා, තාවකාලිකව පත් කරනු ලැබීම හෝ, එකී කැමැත්ත ම ඇතිව, ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබීම හෝ කරනු ලැබිය හැකි ය.

ආයතනයේ වාර්තාව.

21. මණ්ඩලය විසින් එක් එක් මුදල් වර්ෂය අවසානයේ දී, ඒ වර්ෂය සඳහා වූ ආයතනයේ කටයුතු සම්බන්ධයෙන් පළ කරන ලද වාර්තාවක්, අමාත්‍යවරයා මාර්ගයෙන්, ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.